මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :**PRE/2024/80** **2024.09.14**

## ජනාධිපතිවරණය - 2024 සැප්තැම්බර් 21

### යම් අපේක්ෂකයෙක් විසින් වෙනත් අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීම තහනම් බව

මෙම ජනාධිපතිවරණයට තරග කිරීම සඳහා අපේක්ෂකයන් නාමයෝජනා භාර දී ඇත්තේ තමන්ගේ ජයග්‍රහණය වෙනුවෙන් බව මැතිවරණ කොමිෂන් සභාවේ විශ්වාසයයි. එසේ වුවද මේ වන විට සමහර ජනාධිපතිධුර අපේක්ෂකයන් වෙනත් අපේක්ෂකයන් වෙනුවෙන් හෝ ඔවුන් ප්‍රවර්ධනය වන ආකාරයෙන් ප්‍රචාරක කටයුතු කරන බවට මැතිවරණ කොමිෂන් සභාව වෙත පැමිණිලි ලැබී ඇති අතර මැතිවරණ කොමිෂන් සභාවද එම තත්ත්වය පිළිබඳ අවධානය යොමු කොට ඇත.

මෙවැනි ක්‍රියා සම්පූර්ණයෙන්ම මැතිවරණ නීතියට පටහැනි වේ. එවැනි අනීතික ක්‍රියා සිදු නොකරන ලෙස මැතිවරණ කොමිෂන් සභාව සියලුම ජනාධිපතිධුර අපේක්ෂකයන් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ.

එසේම මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස්වලට පටහැනිව අනීතික ලෙස ප්‍රචාරක කටයුතු සිදු කරන්නේ නම් අදාළ දෙපාර්ශවයටම එනම් ප්‍රවර්ධනය කිරීම සිදු කරනු ලබන අපේක්ෂකයාට මෙන්ම ප්‍රවර්ධනයට ලක්වන අපේක්ෂකයාටද මැතිවරණ නීති ප්‍රකාරව කටයුතු කරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

නිදහස් සහ සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා සියලුම අපේක්ෂකයන්ගේ සහය මැතිවරණ කොමිෂන් සභාවට ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමි.

**ආර්.එම්.ඒ.එල්.රත්නායක**
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)